# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

③

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## ව්‍යාපාර සංවිධාන

01. භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක ඒකරාශී වීම අප හඳුන්වනුයේ

(i) පුද්ගල සමූහයක් වශයෙනි.
(ii) ව්‍යාපාර සංවිධානයක් වශයෙනි.
(iii) ව්‍යාපාර කටයුතුවල එකතුවක් වශයෙනි.
(iv) විවිධ කාර්යයන් නිම කිරීමක් වශයෙනි.

02. විවිධ ව්‍යාපාර සංවිධාන බිහිවීමට පදනම වන්නේ

(i) භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම.
(ii) මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.
(iii) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම.
(iv) ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීම.

03. ව්‍යාපාර සඳහා අරමුදල් යොදවමින් අවදානම් භාර ගන්නා පුද්ගලයෝ වන්නේ

(i) ව්‍යාපාරවල සේවකයෝය.
(ii) ව්‍යාපාර සඳහා මුදල් ණයට සපයන්නෝය.
(iii) ව්‍යාපාර ප්‍රධානියෝය.
(iv) ව්‍යාපාර හිමිකරුවෝය.

04. හිමිකාරීත්වය අනුව හඳුනාගත හැකි ව්‍යාපාර වර්ගයක් වන්නේ

(i) පෞද්ගලික අංශයේ ව්‍යාපාර
(ii) ලාභ ලැබීමේ අරමුණක් නොමැති ව්‍යාපාර
(iii) කුඩා පරිමාණ ව්‍යාපාර
(iv) මධ්‍ය පරිමාණ ව්‍යාපාර

05. ව්‍යාපාරිකයෙකු දක්ෂ විය යුත්තේ

(i) සුළු පරිමාණ ව්‍යාපාරයක් සිදු කිරීමට
(ii) විශාල පරිමාණයේ ව්‍යාපාරයක් සිදු කිරීමට
(iii) විදේශ විනිමය උපයන ව්‍යාපාරයක් සිදු කිරීමට
(iv) තමාට ගැළපෙන හා සුදුසු ව්‍යාපාරයක් සිදු කිරීමට



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

06. ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි එක් ආකාරයක් වන්නේ කුමක්ද?

(i) මුදල් යොදවනු ලබන ආකාරය
(ii) අයිතිකරුවන්ගේ හිමිකාරිත්වය
(iii) රැකියා සපයනු ලබන ආකාරය
(iv) ආදායම් උපයනු ලබන ආකාරය

07. ව්‍යාපාර සංවිධාන කිහිපයක නම් පහත දැක් වේ.

A. - සී/ස දිලන (පෞද්ගලික ) සමාගම
B. අනිල් සහ රනිල් ස්ටෝර්ස්
C. රනුග ස්ටෝර්ස්
D. සමනලී ළමා සමාජය

ඉහත ව්‍යාපාර සංවිධාන අතරින් ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) A, B හා C        (ii) A, B හා D
(ii) A, C හා D        (iv) B,C හා D

08. ඉහත ව්‍යාපාර සංවිධාන අතරින් අඛණ්ඩ පැවැත්මක් ඇති නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධානය වන්නේ

(i) A ය.        (ii) B ය.
(ii) C ය.        (iv) D ය.

09. සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හඳුන්වා දෙන ලද්දේ

(i) ශ්‍රී ලංකා මහ බැංකුව
(ii) කාර්මික සංවර්ධන මණ්ඩලය
(iii) කාර්මික තාක්ෂණික ආයතනය
(iv) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

10. ව්‍යාපාරයක් විසින් උපයනු ලබන ලාභය හෝ පාඩුව භුක්ති විඳිනු ලබන්නේ

(i) සේවකයන් විසිනි.
(ii) රජය විසිනි.
(iii) මහජනතාව විසිනි.
(iv) අයිතිකරුවන් විසිනි.

11. පෞද්ගලික අංශයට අයත් නොවන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ

(i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
(ii) විවිධ සේවා සමූපකාර සමිතිය
(iii) සීමාසහිත සමාගම්
(iv) ඒක පුද්ගල ව්‍යාපාර

12. ලාභ අරමුණක් සහිතව පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර සංවිධානය කුමක්ද?

(i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය
(ii) සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
(iii) සමන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරය
(iv) රන්තරු ක්‍රීඩා සමාජය

13. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධානයක් වර්ග කිරීමේදී යොදාගත හැකි නිර්ණායකයක් වන්නේ,

(i) ව්‍යාපාරය ක්‍රියාත්මක වන දින ගණන
(ii) ව්‍යාපාරය උපයන ලාභ ප්‍රතිශතය
(iii) භාවිතා කරන බලශක්ති ප්‍රමාණය
(iv) විදේශ විනිමය උපයනු ලබන ප්‍රමාණය

14. තනි පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ

(i) නීතිමය පුද්ගල භාවයක් පැවතීමයි.
(ii) ස්වාධීනව තීරණ ගත හැකි වීමයි.
(iii) අඛණ්ඩ පැවැත්මක් තිබීමයි.
(iv) ලියාපදිංචිය අනිවාර්ය වී තිබීමයි.

15. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය ලබා ගත යුතු ආයතනය කුමක්ද?

(i) ග්‍රාම නිලධාරී වෙතින්
(ii) සමාගම් රෙජිස්ට්‍රාර් වෙතින්
(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්
(iv) ප්‍රාදේශීය සභාව වෙතින්

16. තනි පුද්ගල ව්‍යාපාර ක්‍රමය තුළින් ලැබිය හැකි විශේෂ වාසියකි.

(i) ලාභය කිහිපදෙනෙකු අතර බෙදී යාමයි.
(ii) නීතිමය බැඳීම් ප්‍රමාණය වැඩි වී තිබීමයි.
(iii) තීරණ ගැනීම සඳහා කාලයක් ගතවීමයි.
(iv) පහසුවෙන් ආරම්භ කළ හැකි වීමයි.

17. තනි පුද්ගල ව්‍යාපාරික ක්‍රමය තුළින් දැකිය හැකි ප්‍රධාන අවාසියකි.

(i) ප්‍රාග්ධනය රැස්කර ගැනීමේ දුෂ්කරතා මතුවීමයි.
(ii) ස්වාධීනව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යා හැකි වීමයි.
(iii) පහසුවෙන් ආරම්භ කළ හැකි වීමයි.
(iv) සියලුම ලාභ අයතිකරු සතු වීමයි.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

18. හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව අවම හා උපරිම වශයෙන් කොපමණද?

(i) 1-20
(ii) 2-20
(iii) 1-50
(iv) 2-50

19. හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමට හේතුවක් විය හැක්කේ,

(i) හවුල්කරුවන් අතර සමානව ලාභය බෙදී යාම.
(ii) හවුල්කරුවකු අසනීප වීම.
(iii) හවුල් ව්‍යාපාරය පාඩු ලැබීම.
(iv) හවුල්කරුවෙකුගේ මිය යාම.

20. හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පනත් කිහිපයක් X තීරුවේද එම පනත් අදාළ වන කරුණු Y තීරුවේද දැක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| 1. | 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත | A | ආරම්භක ප්‍රාග්ධනය රු.1000ට වැඩි නම් ගිවිසුම ලිඛිත විය යුතුය. |
| 2. | 2007 අංක 7 දරණ සමාගම් පනත | B | හවුල් ව්‍යාපාර සඳහා බලපාන ප්‍රධාන පනත |
| 3. | 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත | C | හවුල් ව්‍යාපාරයේ නාමය ලියාපදිංචිය |
| 4. | 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත | D | උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20කට සීමා කර ඇත. |

X හා Y තීරුව නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර ඇතුළත් පේළිය තෝරන්න.

(i) 1A, 2B, 3C, 4D
(ii) 1C, 2D, 3A, 4B
(iii) 1C, 2D, 3B, 4A
(iv) 1A, 2B, 3D, 4C

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ජනහිත" කිරි අලෙවි සැලෙහි අයිතිකරුගේ පරිත්‍යාග ඇතිව, උයන්ගල්ල තරුණ ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් කිහිප දෙනෙකු එකතු වී හිඳවැව මහා විද්‍යාලයේ සිසුන්ට, ඉතා අඩුමිලකට කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරයි.

21. මෙම ව්‍යාපාර කටයුත්තේ උයන්ගල්ල තරුණ ක්‍රීඩා සමාජය අයත් වනුයේ

(i) ලාභ අරමුණක් සහිත ව්‍යාපාරයක් ලෙසය.
(ii) ලාභ අරමුණක් නොමැති ව්‍යාපාරයක් ලෙසය.
(iii) රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් ලෙසය.
(iv) සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙසය.

22. ජනහිත කිරි අලෙවිසැල කුමන ස්වරූපයකට අයත් ව්‍යාපාරයක් විය හැකිද?

(i) රාජ්‍ය සමාගමකි.
(ii) පෞද්ගලික සමාගමකි.
(iii) හවුල් ව්‍යාපාරයකි.
(iv) තනි ව්‍යාපාරයකි.

23. ඉහත සිද්ධියේ ඇතුළත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් වන්නේ

(i) උයන්ගල්ල තරුණ ක්‍රීඩා සමාජය
(ii) තරුණ ක්‍රීඩා සමාජයේ සාමාජික සාමාජිකයින්
(iii) හිඳවැව මහා විද්‍යාලය
(iv) ජනහිත කිරි අලෙවිසැල

24. හිඳවැව විද්‍යාලය සහ ජනහිත කිරි අලෙවිසැලේ අයිතිය බෙදී යන්නේ

(i) රජය සහ පෞද්ගලික අංශය
(ii) රජය සහ රාජ්‍ය දෙපාර්තමේන්තු
(iii) රජය සහ රාජ්‍ය සංස්ථා
(iv) පෞද්ගලික අංශය සහ රජය

25. ජනහිත කිරි අලෙවිසැල සම්බන්ධයෙන් කුමන ප්‍රකාශනය නිවැරදිද?

(i) මෙය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(ii) මෙහි අයිතිකරුගේ වගකීම සීමිත වේ.
(iii) මෙම ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇත.
(iv) මෙම ව්‍යාපාරය ලාභ අරමුණක් නොමැති ව්‍යාපාරයකි.

26. ධීවර කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන් 10 දෙනෙකු ස්වේච්ඡාවෙන් එකට එකතු වී සාමූහික අයිතියක් ඇති සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් ආරම්භ කළේය. ඔවුන් විසින් ආරම්භ කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ

(i) සී/ස පෞද්ගලික සමාගමකි.
(ii) සී/ස පොදු සමාගමකි.
(iii) සමූපකාර සමිතියකි.
(iv) හවුල් ව්‍යාපාරයකි.

27. සංස්ථාපිත සමාගමක් ප්‍රාග්ධනය රැස් කරනු ලබන්නේ

(i) බැංකු ණය ලබා ගැනීමෙනි.
(ii) විවිධ අරමුදල් ලබා ගැනීමෙනි.
(iii) රජයේ මුදල් ලබා ගැනීමෙනි.
(iv) කොටස් නිකුත් කිරීමෙනි.

මාකෙවිට ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

28. නෛතික පුද්ගල භාවයක් හිමිවීමෙන් අදහස් වනුයේ

(i) නීතිමය බලපෑමක් නොමැති වුවද ව්‍යාපාරයක් පැවතීමයි.
(ii) නීතිය ඉදිරියේදී ව්‍යාපාරය නීතිමය පුද්ගලයෙකු ලෙස සළකනු ලැබීමයි.
(iii) ව්‍යාපාරයේ අයිතිකරුවාගේ පුද්ගලික නමින් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලැබීමයි.
(iv) ව්‍යාපාරයට වැඩි නීතිමය ඉඩකඩක් ලැබී නොමැති බවයි.

29. ව්‍යාපාරයක අසීමිත වගකීම නමැති ලක්ෂණයෙන් අදහස් වනුයේ

(i) ව්‍යාපාරයේ බාහිර ණය සඳහා අසීමිතව වගකිව යුතු බවයි.
(ii) ව්‍යාපාරයේ බාහිර ණය සඳහා අසීමිත වගකීමක් නොමැති බවයි.
(iii) වෙනත් බාහිර ගනුදෙනු ව්‍යාපාරයට සම්බන්ධ නොමැති බවයි.
(iv) ව්‍යාපාර ගනුදෙනු සඳහා නීතිමය බැඳීමක් නොමැති බවයි.

30. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිතව පවතින ව්‍යාපාර සංවිධානයක් ලෙස හඳුනා ගනු ලබන්නේ කුමක්ද?

(i) චමින්ද සහ පුත්‍රයෝ ව්‍යාපාරය
(ii) තල්විට විවිධ සේවා සමූපකාර සමිතිය
(iii) ටෙලිකොම් පොදු සමාගම
(iv) ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

31. පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන වර්ග කිහිපයකි. එම ව්‍යාපාර දී ඇති පරිදි වර්ගීකරණය කරන්න.

| ව්‍යාපාර ආයතනය | අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය | හිමිකාරීත්වය අනුව වර්ග කිරීම. |
|---|---|---|
| i) සීමාසහිත විද්‍යානි සමාගම | | |
| ii) ජනජය ස්ටෝර්ස් | | |
| iii) රංජිත් සහ පුත්‍රයෝ | | |
| iv) මධ්‍යම ගමනාගමන මණ්ඩලය | | |
| v) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | | |

32. පහත සඳහන් අවස්ථාවල දී ඇති හිස්තැන සඳහා සුදුසු පිළිතුරක් මගින් හිස්තැන සම්පූර්ණ කරන්න.

| | තනි පුද්ගල ව්‍යාපාර | හවුල් ව්‍යාපාර | සීමාසහිත සමාගම් |
|---|---|---|---|
| අයිතිය | | | |
| ප්‍රාග්ධනය රැස් කිරීම. | | | |
| නෛතික පුද්ගලභාවය | | | |
| අඛණ්ඩ පැවැත්ම | | | |
| වගකීම | | | |

33. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(i) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව රජය සතු ව්‍යාපාරයකි. (.......)
(ii) නීතිමය කටයුතුවලදී රජයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතුය. (.......)
(iii) රජයේ දෙපාර්තමේන්තුවලට අඛණ්ඩ පැවැත්මක් නොමැත. (.......)
(iv) ජනතාවට අත්‍යාවශ්‍ය සේවාවන් බොහොමයක් සපයනු ලබන්නේ රජයේ සංස්ථා මඟිනි. (.......)

34. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(i) රාජ්‍ය සංස්ථාවල අයිතිය හා පාලනය සෑමවිටම පූර්ණ වශයෙන් රජය සතු වේ. (.......)
(ii) රාජ්‍ය සංස්ථා විශේෂ පනතක් හෝ පොදු පනතක් මඟින් ආරම්භ කළ හැක. (.......)
(iii) රජයේ සංස්ථාවලට අඛණ්ඩ පැවැත්මක් නොමැත. (.......)
(iv) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. (.......)

35. "සමූපකාර සමිතියක ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතී" යැයි ප්‍රකාශ කිරීමට හේතුවන වගන්තිය ඉදිරියෙන් සත්‍ය අසත්‍ය බව දක්වන්න.

(i) සාමාජිකයින් වැඩිදෙනෙකුගේ කැමැත්ත මත පාලනය වීමක් සිදුවීම. (.......)
(ii) අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරාගෙන ඔවුන් විසින් පාලනය මෙහෙයවීම. (.......)
(iii) සමූපකාරයේ සභාපතිගේ අභිමතය පරිදි ව්‍යාපාර කටයුත්ත කරගෙන යා හැකිවීම. (.......)
(iv) අවශ්‍ය අවස්ථාවලදී ඡන්ද බලය පාවිච්චි කළ හැකි වීම. (.......)

36. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය අසත්‍යද යන්න දක්වන්න.

(i) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ලෙස වර්ග කළ හැකිය. (.......)
(ii) ඒක පුද්ගල ව්‍යාපාරයක අයිතිකරුගේ වගකීම යෙදූ ප්‍රාග්ධනයට පමණක් සීමා වේ. (.......)
(iii) හවුල් ගිවිසුම ලිඛිත වූ විට එය හවුල් ඔප්පුව ලෙස නම් කරයි. (.......)
(iv) නීතිමය කටයුතුවලදී හවුල්කරුවන් ඔවුන්ගේ නම්වලින් පෙනී සිටිය යුතුය. (.......)
(v) සී/ස සමාගමක ප්‍රාග්ධනය බෙදිය හැකි කුඩාම ඒකකය කොටසක් ලෙස හඳුන්වයි. (.......)

37. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය අසත්‍යද යන්න දක්වන්න.

(i) සමාගමක කොටස්කරුවන් මිය යාම, බුන්වත් වීම වැනි හේතූන් සමාගමේ පැවැත්මට බාධා ඇති කරයි. (.......)
(ii) සමූපකාර සමිතියකට ප්‍රාග්ධනය රැස් කර ගන්නා ප්‍රධාන මාර්ගය සාමාජික අරමුදල්ය. (.......)
(iii) ප්‍රාග්ධනය සීමිත වීම හා ප්‍රතිපත්ති මතම කටයුතු කළ යුතු වීම සමූපකාර සමිතිවල අවාසි දෙකකි. (.......)
(iv) ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා කෘෂි රක්ෂණ මණ්ඩලය රාජ්‍ය සංස්ථා සඳහා නිදසුන් දෙකකි. (.......)
(v) රටේ මහජනතාව සඳහා අත්‍යවශ්‍ය වන සේවා සැපයීම සඳහා වඩාත් යෝග්‍ය ව්‍යාපාර ක්‍රමය වන්නේ රාජ්‍ය දෙපාර්තමේන්තුය. (.......)

38. පහත සඳහන් ව්‍යාපාර සංවිධාන අරමුණ හා හිමිකාරිත්වය අනුව වර්ගීකරණය කරන්න.

| ව්‍යාපාර ආයතනය | වර්ගීකරණය | |
|---|---|---|
| | අරමුණ අනුව | හිමිකාරිත්වය අනුව |
| ක්‍රීඩා සමාජ | | |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| රණමයුර සමාගම | | |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | |

39. පහත සඳහන් අවස්ථාවලදී තනි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර අතර තිබෙනුයේ සමානකමක්ද අසමානකමක්ද යන්න දක්වන්න.

| කරුණ | සමාන/අසමාන බව |
|---|---|
| නෛතික පුද්ගලභාවය | |
| අඛණ්ඩ පැවැත්ම | |
| වගකීම | |
| සාමූහික තීරණ ගැනීම | |

40. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගකර දක්වන ගැලීම් සටහන පහත දැක්වේ. හිස්තැනට ගැළපෙන වචනය ලියා දක්වන්න.

ව්‍යාපාර සංවිධාන

(1) ...........................

- ඒක පුද්ගල ව්‍යාපාර

(3) ............................

(4) ............................

(5) ............................

(6) ............................

(2) ...........................

- රාජ්‍ය සංස්ථා

(7) ............................

(8) ............................

41. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන ගැලීම් සටහනකින් දක්වන්න..
42. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගකර දක්වන්න.
43. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන නිර්ණායක 4ක් නම් කරන්න.
44. (අ.) ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි 03ක් ලියන්න.
    (ආ.) ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසි 03ක් ලියන්න.

45. (අ.) හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි 03ක් ලියන්න.
    (ආ.) හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසි 03ක් ලියන්න.
46. (අ.) ඒක පුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක දැකිය හැකි වාසි 02ක් අවාසි 02ක් ලියන්න.
    (ආ.) හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව ඒක පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි වාසි 02ක් අවාසි 02ක් ලියන්න.
47. (අ.) සී/ස සමාගම්වල වාසි 03 ක් ලියන්න.
    (ආ.) සී/ස සමාගම්වල අවාසි 02 ක් ලියන්න.

48. (අ.) සමූපකාර සමිතිවල වාසි 03ක් ලියන්න.
    (ආ.) සමූපකාර සමිතිවල අවාසි 02 ක් ලියන්න.

49. (අ.) රාජ්‍ය සංස්ථාවල වාසි 03 ක් ලියන්න.
(ආ.) රාජ්‍ය සංස්ථාවල අවාසි 02 ක් ලියන්න.

50. (අ.) රාජ්‍ය දෙපාර්තමේන්තුවල වාසි 03 ක් ලියන්න.
(ආ.) රාජ්‍ය දෙපාර්තමේන්තුවල අවාසි 02 ක් ලියන්න.

51. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැළකිල්ලට ගනු ලබන සාධක 03 ක් ලියන්න.

52. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය ලියා දක්වන්න.

53. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන බොධාව